මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circular Letter
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.03. 17 -

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා , ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**<u>මැද පෙරදිග කලාපයේ නිර්මාණය වී ඇති යුධ ගැටුම් හේතුවෙන් ඉදිරියේ දී</u>**

**<u>මතුවිය හැකි ඉන්ධන සපයා ගැනීමේ ගැටලුව සැලකිල්ලට ගෙන</u>**

**<u>එයට මුහුණ දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක EST-6/03/LEA/1060(i) සහ 2026.03.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2026 රජය සතු සමාගම් සඳහා ද අදාළ කර ගත යුතු ය.

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2026

මගේ අංකය : EST-6/03/LEA/1060(i)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2026.03.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>මැද පෙරදිග කලාපයේ නිර්මාණය වී ඇති යුධ ගැටුම් හේතුවෙන් ඉදිරියේ දී මතුවිය හැකි ඉන්ධන සපයා ගැනීමේ ගැටලුව සැලකිල්ලට ගෙන එයට මුහුණ දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම</u>**

රජයේ කාර්යාල සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමේ දී නිලධරයන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා මෙන්ම කාර්යාල විවෘතව පවත්වාගෙන යාම සඳහා සැලකිය යුතු තරම් ඉන්ධන ප්‍රමාණයක් භාවිත කෙරේ. ඒ අනුව, මැද පෙරදිග කලාපයේ නිර්මාණය වී ඇති යුධ ගැටුම් හේතුවෙන් ඉදිරියේ දී ඉන්ධන සපයා ගැනීමේ අවිනිශ්චිත තත්ත්වයක් ඇතිවුවහොත් එයට මුහුණ දීම සඳහා දැනට පවතින ඉන්ධන සංචිත අරපිරිමැස්මෙන් යුතුව භාවිත කළ යුතු අතර, එම තත්ත්වය සැලකිල්ලට ගෙන අත්‍යවශ්‍ය සේවාවලට වඩා වැඩි ඉඩක් ලබාදීම වෙනුවෙන් රජයේ කාර්යාල පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කිරීමට 2026.03.16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. නැවත දැනුම් දෙන තුරු සෑම සතියක ම බදාදා දිනය රජයේ කාර්යාල කටයුතු සඳහා නිවාඩු දිනයක් ලෙස සැලකිය යුතු ය. ඒ අනුව, බදාදා දිනය තුළ මේ වන විට ක්‍රියාත්මක වන රාජකාරි එම සතියේ අඟහරුවාදා දිනට යොදා ගත යුතු ය. එසේ වුව ද, යම් නිලධරයෙකු එදිනට සේවයේ යෙදවිය යුතු යැයි ආයතන ප්‍රධානියා විසින් තීරණය කරනු ලබන්නේ නම් අදාළ නිලධරයන් සේවයට කැඳවීමට මෙය බාධාවක් නොවිය යුතු අතර, ඒ සඳහා නිවාඩු දින වැටුප්, අතිකාල හෝ හිලව් නිවාඩු ලබා නොදිය යුතු ය.

03. නිලධරයෙකු සේවා ස්ථානයට නොකැඳවා ඔහුට පැවරී ඇති රාජකාරි ඉටුකරවා ගැනීමට අවශ්‍ය ආයතනික තාක්ෂණික පහසුකම් දැනටමත් පවතින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ට/ රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්ට එම නිලධරයාගේ සේවය ඔහු/ ඇය සේවා ස්ථානයට නොකැඳවා ලබාගැනීමට හැකි වැඩපිළිවෙලක් සකසා ගත හැකි ය.

04. එසේම, බදාදා දිනයේ වසා තබන කාර්යාලවල නිලධරයන් එම සතියේ සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක දී අතිකාල ගෙවීමේ පදනමින්, නිවාඩු දින වැටුප් ගෙවීමේ පදනමින් හෝ හිලව් නිවාඩු ලබාදීමේ පදනමින් හෝ සේවයේ නොයෙදවිය යුතු ය.

05. එසේ වුව ද, සේවයේ හදිසි අවශ්‍යතාවක් මත සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක දී හෝ ස්වකීය ආයතනයේ නිලධරයන් සේවයට කැඳවීමේ අවශ්‍යතාවක් ඇතිවුවහොත් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ/ පළාත් ප්‍රධාන ලේකම්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ රාජ්‍ය සංස්ථා හා

ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්ගේ අනුමතිය ඇතිව අදාළ ආයතන ප්‍රධානියාට එම නිලධරයන් සේවයට කැඳවීමට බාධාවක් නොමැත. එසේ සේවයට කැඳවනු ලබන නිලධරයන් සඳහා අතිකාල දීමනා , නිවාඩු දින වැටුප් හෝ හිලව් නිවාඩු ලබා දීමට බාධාවක් නොමැත. තව ද, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇතිවූ ආපදා වලට අදාළ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය නිලධරයන් කැඳවීමේ බලය අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පැවරේ.

06. අධිකරණ ක්ෂේත්‍රයට අයත් ආයතන වෙත නිලධරයන් සේවයට කැඳවීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ඇත.

07. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින පාසල් ඇතුලු අධ්‍යාපන ආයතන, මෙම කාල සීමාව තුළ පවත්වා ගෙන යාම පිළිබඳව අවශ්‍ය උපදෙස් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දෙනු ඇත.

08. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළව මෙම චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී යම් ගැටලුවක් මතුවුවහොත්, ඒ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විමසා එකී උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය.

09. තවද, රජයේ ආයතනවල උත්සව සම්මන්ත්‍රණ වැනි දේ සංවිධානය කිරීම නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය. මෙහි දී රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2022.03.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2022 කෙරෙහි ද අවධානය යොමු කර කටයුතු කරන මෙන් වැඩිදුරටත් අවධාරණය කරමි.

10. තව ද, රජයේ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු අතර, එම අත්‍යවශ්‍ය සේවා සපයන ආයතන සඳහා මෙන් ම අමාත්‍යාංශ ලේකම්වරයෙකු/ පළාත් ප්‍රධාන ලේකම්වරයෙකු/ රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානියෙකු විසින් බදාදා දිනයේ දී විවෘතව තැබිය යුතු බවට තීරණය කරනු ලබන ආයතන සඳහා ද මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර නොගත යුතු ය. එම ආයතන මෙම දිනය සාමාන්‍ය රාජකාරි දිනයක් සේ සලකා කටයුතු කළ යුතු ය. එමෙන්ම මේ වන විට සේවා මුර ක්‍රමය යටතේ නිලධරයන් සේවයේ යොදවනු ලැබූ රාජ්‍ය ආයතන සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර නොගත යුතු ය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ad-6-est@pubad.gov.lk